# UNIVERSITY OF RUHUNA

**Calling for applications to fill non-academic staff vacancies**

**(Internal applicants only)**

Applications are invited from suitably qualified, confirmed permanent employees of the University Grants Commission or a university or an affiliated higher education institution and who have fulfilled the necessary qualifications for the following vacant posts at the University of Ruhuna.

## 01. Marshal (Grade II) - Male

**Qualifications:**

1. A graduate of a recognized University / Higher Educational Institution.

   Physique : Height : 5'5"
   Chest : 32" deflated

   **Note:** preference will be given to those who possess experience in Police / Armed Forces and active participation in sports activities, social welfare activities within the university and at national level.

   OR

2. A person who has experience in a post not below the rank of Major in the Armed Forces in Sri Lanka or not below the equivalent rank in Sri Lanka Police.

**Age:** Between 30 -45 years.

**Method of Recruitment:** Selection by a structured interview

**Salary Scale:** UMN 3(II) – Rs. 71,365 – 18 x 1,190 – 92, 785 p.m. (From 01.01.2027)

## 02. Technical Officer (Grade II Segment "A")

**Qualifications:**

1. National Diploma in Technology or equivalent qualification

   OR

2. Higher National Diploma in Engineering

   OR

3. Higher National Diploma in the relevant field

   OR

3. Diploma in the relevant field of at least two (02) years' full- time duration obtained from a recognized Institute with one (01) year experience in the relevant field.

**Note:** According to the nature of the post, the identified relevant fields are Agriculture/ Animal Husbandry/ Engineering/ Sciences/ Technology/ Medical Laboratory Technology etc. however; the acceptability of the field shall be decided by the faculty concerned.

**Salary Scale:** U-MT I (II) Rs. 57,435 – 7x640; 9x890 – 69,925 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** Selection by Practical test and interview

## 03.Technical Officer (Grade II Segment "B")

**Qualifications:**

I. Passed in 6 Subjects at the G.C.E. Ordinary Level Examination including five (05) credits obtain in not more than two sitting. The credit passes should include Science and Mathematics

OR

II. Pass in 6 subjects at the G.C.E. Ordinary Level examination obtain in not more than three sitting and 8 years satisfactory permanent service in UGC or a Higher Education/ Institute. The subject pass should include Science and Mathematics.

OR

III. Fifteen years (15) satisfactory permeant service as a Laboratory Attendant in a Higher Educational Institution/ Institute.

**Note:-** Appointment under "Segment B" of the technical Officer's service will be made as "Trainee Technical Officer" for a period of 03 years on a fixed salary of Rs. 51,095 + (other allowances) . At the conclusion of training those who have gained competence in Laboratory techniques, including maintenance of inventories and ability to type in English will be confirmed and appointment made to permanent post of Technical Officer Grade II – Segment "B".

**Salary Method:** U-MT 1 (III) Rs. 51,095 – 7 x 540; 10 x 640 – 60,575 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** Selection by aptitude test and Structured Interview.

## 04.Supervisor (Landscape) Grade III

**Qualifications:**

1.(a) (i). G.C.E. (Ordinary Level) Examination in Six (6) subjects at not more than two (2) Sittings.

AND

(ii). Successful completion of one year's practical training course in Agriculture conducted by the Department of Agriculture of equivalent.

(b) An Employee of the UGC or a Higher Educational Institution who has passed the G.C.E. (Ordinary Level) Examination at not more than 3 sittings and possessing 10 Years' experience in landscape work in the UGC in a Higher Educational Institution, and/or a Botanical Garden.

**Salary Method:** UMT 1(III) Rs. 51,095 - 7 x 540; 10 x 640 – 60,575/= (p.m.) (From 01.01.2027)

**Method of Recruitment:** Selection by interview

## 05.Management Assistant (Store-Keeping) (Grade III)

**Qualifications:**

I. Should have passed the G.C.E.(O/L) Examination in six (06) subjects at one sitting with credit passes in: -

I. Sinhala Language/ Tamil Language
II. English Language/ English Literature
III. Mathematics

AND

II. Should have passed in all subjects at G.C.E. (A/L) Examination (except the Common General papers) at one sitting.

**Preference will be given to those who possess the following**:

(a) An acceptable qualification in computer applications of not less than six (06) months duration obtained from a recognized institute.

AND

(b) Two years of experience in the use of computer application packages

**Post Specific Qualifications**

One year experience in Store-keeping and/or a pass in the subject of Commerce at the G.C.E. (Ordinary Level) Examination or in the subject of Accountancy at the G.C.E. (Advanced Level) Examination.

**Note**: A Security Deposit to be furnished as determined by the UGC/ Higher Educational Institution.

**Salary Scale**: U-MN 1 (III) Rs 49,475-17×540 – 58,655 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** By Written Examination (75% marks) of following Subjects:

- Knowledge in Sinhala/Tamil & English Language
- Intelligence quotient and General Knowledge
- (Computer Literacy)
- Relevant Subject area.

and

- Interview (25% marks)

## 06.Mechanic (Grade III)

**Qualifications:**

I. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Unskilled (U-PL 1) who have Been confirmed in the present post and having obtained a Proficiency Certificate not below than the National Vocational Qualification (NVQ) Level 4 issued by a Technical/ Vocational training institute accepted by the Tertiary and Vocational Education Commission, relevant to the function of above post.

OR

II. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Un-skilled (U-PL I) who have been confirmed in the present post and completed a minimum of five (05) years working experience in the relevant field with skills not below than the National Vocational Qualification (NVQ) Level 2, proven at a trade test.

**Salary Scale:** UPL 3 (III) –Rs 48,005 – 16 X 490; 55,845 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** Selection by structured interview and a Trade Test.

## 07.Machinist (Grade III)

**Qualifications:**

I. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Unskilled (U-PL 1) who have been confirmed in the present post and having obtained a Proficiency Certificate not below than the National Vocational Qualification (NVQ) Level 4 issued by a Technical/ Vocational training institute accepted by the Tertiary and Vocational Education Commission, relevant to the function of above post.

OR

II. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Un-skilled (U-PL I) who have been confirmed in the present post and completed a minimum of five (05) years working experience in the relevant field with the skills not below than the National Vocational Qualification (NVQ) Level 2, proven at a trade test.

**Salary Scale:** UPL 3 (III) –Rs 48,005 – 16 X 490; 55,845 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** Selection by structured interview and a Trade Test.

## 08. Carpenter (Grade III)

**Qualifications:**

I. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Unskilled (U-PL 1) who have been confirmed in the present post and having obtained a Proficiency Certificate not below than the National Vocational Qualification (NVQ) Level 4 issued by a Technical/ Vocational training institute accepted by the Tertiary and Vocational Education Commission, relevant to the function of above post.

OR

II. Employees in Primary Level Semi-Skilled (U-PL 2) or Un-skilled (U-PL I) who have been confirmed in the present post and completed a minimum of five (05) years working experience in the relevant field with the skills not below than the National Vocational Qualification (NVQ) Level2, proven at a trade test.

**Salary Scale:** UPL 3 (III) –Rs 48,005 – 16 X 490; 55,845 p.m. (From 01.01.2027)

**Method of Recruitment:** Selection by structured interview and a Trade Test.

## 09.Laboratory Attendant (Grade III)

**Qualifications:**

1. Employees of Primary Level Unskilled (U-PL1) who have been confirmed in the present post and should have passed the G.C.E. (O/L) Examination in six (06) subjects with at least two (02) credit passes in not more than two sittings and having obtained a proficiency certificate not bellow than the National Vocational Qualifications (NVQ) Level 2 or 3, issued by a Technical/Vocational training institute accepted by the Tertiary and Vocational Education Commission, relevant to the function of above post.

OR

2. Employees of Primary Level Unskilled (U-PL1) who have been confirmed in the present post and should have passed the G.C.E. (O/L) Examination in six (06) subjects with at least two (02) credit passes in not more than two sittings and one (01) year working experience in a relevant field with industrial skills.

OR

3. Employees of Primary Level Unskilled (U-PLl) who have been confirmed in the present post and completed a minimum of five (05) years working experience in the relevant field with industrial skills.

**Salary Scale**: UPL 2 (III) –Rs 44,575 – 16 X 490-52,415 p.m. (From 01.01.2027)

**Recruitment:** Selection by structured interview and a Trade Test.

## 10.Nurseryman (Grade III)

**Qualifications:**

1. Employees of Primary Level Unskilled (U-PL1) who have been confirmed in the present post and Should have passed the G.C.E. (O/L) Examination in six (06) subjects with at least two (02) credit passes in not more than two sittings and having obtained a proficiency certificate not bellow than the National Vocational Qualifications (NVQ) Level 2 or 3, issued by a Technical/Vocational training institute accepted by the Tertiary and Vocational Education Commission, relevant to the function of above post.

OR

2. Employees of Primary Level Unskilled (U-PL1) who have been confirmed in the present post and Should have passed the G.C.E. (O/L) Examination in six (06) subjects with at least two (02) credit passes in not more than two sittings and one (01) year working experience in a relevant field with industrial skills.

OR

3. Employees of Primary Level Unskilled (U-PLl) who have been confirmed in the present post and completed a minimum of five (05) years working experience in the relevant field with industrial skills.

**Salary Scale**: UPL 2 (III) –Rs 44,575 – 16 x 490-52,415 p.m. (From 01.01.2027)

**Recruitment:** Selection by structured interview and a Trade Test.

## Other Information

- In addition, other allowances approved by the government will be paid, and the salary will be paid in accordance with the guidelines stipulated in Management Services Circular No. 6/2025 and University Grants Commission Circular No. 2/2025(i).

**APPLICATIONS & PARTICULARS**

01. All applicants should first submit their applications through the online system only on or before **24.08.2026**. To submit applications through the online system, applicants should visit the web link **https://internalapplication.ruh.ac.lk/** Then, they should carefully read the instructions mentioned on the web page that opens and submit their applications by following them. The online application process will be open on **28.07.2026 and will end on 24.08.2026**.

02. All applicants are hereby directed to download the application form (bearing the reference number) submitted online and to forward the duly completed hard copy to the Deputy Registrar, Non-Academic Establishment Division, University of Ruhuna, Wellamadama, Matara, on or before **24.08.2026**, through the Secretary, Registrar, Director, or Head of the institution.

03. The University of Ruhuna reserves the right to shortlist candidates. Applications that do not meet the required qualifications, are incomplete, unclear or are received after the due date will be rejected. Applications that are not forwarded by the head of the institution where they work will also be rejected. The University of Ruhuna informs all internal applicants that those encountering technical difficulties while submitting their applications online may contact the University hotline 041-2227001 for immediate assistance

**Acting Registrar**
**University of Ruhuna,**
**28.07.2026**

# රුහුණ විශ්වවිද්‍යාලය

## අනධ්‍යයන කාර්යය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

## ( අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි)

රුහුණ විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාලයක හෝ ඊට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනයක **ස්ථිර සේවයේ නියුතු සේවය තහවුරු කරන ලද සහ අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති සේවක භවතුන්ගෙන්** අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. ශිෂ්‍ය විනය පාලක (II ශ්‍රේණිය) - පිරිමි

**සුදුසුකම්:**

1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් / උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

   ශරීරය: උස: 5’5”

   පපුව: 32” ට අඩු

   **සටහන:** පොලිස් / සන්නද්ධ හමුදා පිළිබඳ අත්දැකීම් ඇති සහ විශ්වවිද්‍යාලය තුළ සහ ජාතික මට්ටමින් ක්‍රීඩා කටයුතු, සමාජ සුභසාධන කටයුතු සඳහා ක්‍රියාකාරී සහභාගීත්වයක් ඇති අයට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

   හෝ

2. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල මේජර් තනතුරට නොඅඩු හෝ ශ්‍රී ලංකා පොලිසියේ සමාන තනතුරකට නොඅඩු තනතුරක අත්දැකීම් ඇති පුද්ගලයෙකුවීම.

**වයස:** අවුරුදු 30-45 අතර.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම

**වැටුප් පරිමාණය:** UMN 3(II) – රු. 71,365 – 18 x 1,190 – 92, 785 මාසික (2027.01.01 සිට)

### 2. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ "අ" කණ්ඩය

**සුදුසුකම්:**

1. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හෝ ඊට සමාන සුදුසුකම්

   හෝ

2. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව

   හෝ

3. අදාළ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව

   හෝ

පිළිගත් ආයතනයකින් ලබාගත් අවම වශයෙන් අවුරුදු දෙකක (02) පූර්ණ කාලීන අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්දක් තිබීම.

සටහන: තනතුරේ ස්වභාවය අනුව, හඳුනාගත් අදාළ ක්ෂේත්‍ර වන්නේ කෘෂිකර්මය/ සත්ව පාලනය/ ඉංජිනේරු/ විද්‍යා/ තාක්ෂණය/ වෛද්‍ය රසායනාගාර තාක්ෂණය යනාදියයි. කෙසේ වෙතත්; ක්ෂේත්‍රයේ පිළිගැනීම අදාළ පීඨය විසින් තීරණය කරනු ලැබේ.

**වැටුප් පරිමාණය** : U-MT I (II) රු. 57,435 – 7x640; 9x890 – 69,925 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 3. තාක්ෂණික නිළධාරී (II ශ්‍රේණිය) "ආ" ඛණ්ඩය

**සුදුසුකම් :**

I. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ පහක් (05) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම. සම්මාන සාමාර්ථ ලබා ගත් විෂයන් අතරට විද්‍යාව සහ ගණිතය යන විෂයන් ඇතුළත් විය යුතුය.

හෝ

II. තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/ පෙළ ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය යන විෂයන් දෙක ඇතුළුව විෂයන් 6 කින් සමත්වී තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක වසර 8 ක සතුටු දායක ස්ථිර සේවා කාලයක් ලබා තිබීම.

හෝ

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යාතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම

**සටහන :** තාක්ෂණික නිලධාරියාගේ සේවයේ "ආ ඛණ්ඩය " යටතේ පත්වීම් ලබන අය "පුහුණුලාභී තාක්ෂණික නිලධාරි" ලෙස වසර 03 ක කාලයක් සඳහා රු. 51,095 + (වෙනත් දීමනා) ක ස්ථාවර වැටුපක් මත සිදු කරනු ලැබේ. පුහුණුව අවසානයේ ඉන්වෙන්ටරි නඩත්තු කිරීම සහ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීමේ හැකියාව ඇතුළුව රසායනාගාර ශිල්පීය ක්‍රම පිළිබඳ නිපුණතාවයක් ලබා ඇති අය ස්ථිර කර තාක්ෂණික නිලධාරී II ශ්‍රේණියේ - "ආ" ඛණ්ඩය ස්ථිර තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් පරිමාණය** : U-MT 1 (III) රු. 51,095 – 7 x 540; 10 x 640 – 60,575 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම** : අභියෝගතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 4. පරිපාලක (භූමි දර්ශක) III ශ්‍රේණිය

**සුදුසුකම්** :

1.(අ) (i).අ.පො.ස.(සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 ක් සමත් වී තිබීම

සහ

(ii). කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කෘෂිකර්මාන්තය පිළිබඳ වසරක ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

සහ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයත් උසස් අධ්‍යාපන ආයතනයක සහ/හෝ උද්භිද උද්‍යානයක භූමි අලංකරණ කටයුතු පිළිබඳ වසර දහයක (10) පළපුරුද්දක් ඇති, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය වාර තුනකට (03) නොවැඩි වාර ගණනකදී සමත් වූ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන සේවකයෙකු විය යුතුය.

**වැටුප් පරිමාණය :** UMT 1(III) රු. 51,095 - 7 x 540 ; 10 x 640 - 60,575/= මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මඟින්

## 5. කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

i. අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී

- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

ii. අ.පො.ස උසස් පෙළ විභාගයේදී එක් වරකදි ( සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත්ව තිබීම

සහ

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද ලබා තිබීම.

**තනතුර සඳහා විශේෂිත සුදුසුකම්**

ගබඩාකරණය පිළිබඳ වසරක පළපුරුද්ද සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂය සමත්වීම.

**සටහන:** විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය.

**වැටුප් පරිමාණය :** U-MN 1(III) රු. 49,475-17×540 – 58,655 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම :**

පහත සඳහන් විෂයයන් යටතේ පවත්වනු ලබන ලිඛිත විභාගයක් (ලකුණු 75%);

ලිඛිත විභාගයේ විෂයයන්:

- සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැනුම
- බුද්ධි පරීක්ෂණය (Intelligence Quotient) හා සාමාන්‍ය දැනුම
- (පරිගණක සාක්ෂරතාව)
- අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම

සම්මුඛ පරීක්ෂණය (ලකුණු 25%)

## 6. කාර්මික (III ශ්‍රේණිය)

**සුදුසුකම්:**

I. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන , වත්මන් තනතුරේ තහවුරු කර ඇති අතර ඉහත තනතුරේ කාර්යයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

හෝ

II. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා ( Semi Skills) (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන, වත්මන් තනතුරේ ස්ථිර කර ඇති අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 මට්ටමට නොඅඩු කුසලතා වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

**වැටුප් පරිමාණය:** UPL 3 (III) - රු. 48,005 - 16 X 490;55,845 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම:** ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින්

## 7. යන්ත්‍ර ක්‍රියාකරු (III ශ්‍රේණිය)

**සුදුසුකම්:**

I. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන , වත්මන් තනතුරේ තහවුරු කර ඇති අතර ඉහත තනතුරේ කාර්යයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

හෝ

II. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා ( Semi Skills) (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන, වත්මන් තනතුරේ ස්ථිර කර ඇති අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 මට්ටමට නොඅඩු කුසලතා වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

**වැටුප් පරිමාණය:** UPL 3 (III) - රු. 48,005 - 16 X 490;55,845 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම:** ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින්

## 8. වඩු කාර්මික (III ශ්‍රේණිය)

**සුදුසුකම්:**

I. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන , වත්මන් තනතුරේ තහවුරු කර ඇති අතර ඉහත තනතුරේ කාර්යයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 4 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

හෝ

II. ප්‍රාථමික මට්ටමේ අර්ධ කුසලතා ( Semi Skills) (U-PL 2) හෝ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන, වත්මන් තනතුරේ ස්ථිර කර ඇති අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර තිබීම සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 මට්ටමට නොඅඩු කුසලතා වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

**වැටුප් පරිමාණය:** UPL 3 (III) - රු. 48,005 - 16 X 490;55,845 මාසික (2027.01.01 දින සිට)

**බඳවා ගැනීම:** ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණයකින්

## 9. විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)

### සුදුසුකම්

I. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස.(සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වී තිබීම හා තනතුරට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තෘතීය/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

II. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස.(සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වී තිබීම හා අදාළ ක්ෂේත්‍රෙය් කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

III. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රෙය් කාර්මික කුසලතා සමග අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය: UPL 2 (III) -** රු. 44,575 - 16 X 490; 52,415 මාසික (2027.01.01 සිට)

**බඳවා ගැනීම:** ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 10. තවාන්කරු (III ශ්‍රේණිය)

### සුදුසුකම්

I. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස.(සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වී තිබීම හා තනතුරට අදාළ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තෘතීය/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

II. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස.(සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ 02 ක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් සමත් වී තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

III. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමග අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය: UPL 2 (III) -** රු. 44,575 - 16 X 490; 52,415 මාසික (2027.01.01 සිට)

**බඳවා ගැනීම:** ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## වෙනත් කරුණු

ඉහත සියලු තනතුරු සඳහා රජය විසින් අනුමත කරන ලද අනෙකුත් දීමනාද ගෙවනු ලබන අතර, වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 6/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2/2025 (i) හි සඳහන් උපදෙස් අනුව ගෙවනු ලැබේ.

## අයදුම්පත් සහ විස්තර

01. සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් **2026.08.24** දින හෝ ඊට පෙර මාර්ගගත පද්ධතිය හරහා පමණක් ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත පද්ධතිය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා, අයදුම්කරුවන් https://internalapplication.ruh.ac.lk/ වෙබ් සබැඳිය වෙත පිවිසිය යුතුය. ඉන්පසුව විවෘත වන වෙබ් පිටුවෙහි සඳහන් උපදෙස්මාලාව (Instructions) හොඳින් කියවා එය අනුගමනය කරමින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත අයදුම්පත් **ක්‍රියාවලිය 2026.07.28 දින සිට විවෘත වන අතර 2026.08.24** දිනෙන් අවසන් වේ.

02. සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ඉදිරිපත් කරන ලද අයදුම්පත ( යොමු අංකය සහිත) බාගත කර එම දෘඪ පිටපත ( Hard Copy ) ලේකම්, ලේඛකාධිකාරී, අධ්‍යක්ෂක හෝ ආයතන ප්‍රධානියා හරහා නියෝජ්‍ය ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර යන ලිපිනයට **2026.08.24** දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

03. අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කිරීමේ (Shortlist) අයිතිය රුහුණ විශ්වවිද්‍යාලය සතුය. අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති, අසම්පූර්ණ , අපැහැදිලි හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මඟින් යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් මාර්ගගත ක්‍රමය මඟින් යොමු කිරීමේදී තාක්ෂණික ගැටළු ඇතිවුවහොත් 041- 2227001 දුරකථන අංකය අමතා ගැටලු විසඳා ගැනීමට පහසුකම් අයදුම් කරුවන්ට රුහුණ විශ්වවිද්‍යාලය විසින් සළසා ඇති බව අභ්‍යන්තර අයදුම්කරුවන් වෙත කාරුණිකව දන්වමි.

**වැඩබලන ලේඛකාධිකාරී**
**රුහුණු විශ්වවිද්‍යාලය,**
**2026.07.28**